


## සිඩ්නි සිට ලියමි

ශ්‍රී ලංකාවේ සිට මේ දකුණු කුරු දිවයිනට පැමිණ සිටින සිංහල අප බොහෝ දෙනෙකු ගේ සුවිශේෂී අවශ්‍යතාවයක් වනුයේ අප සතු සිංහල සංස්කෘතික උරුමය අපේ මතු පරම්පරාවට ද දයාද කොට දීමටයි.
සංස්කෘතිය යන වදනත් සමගම අපේ සිහියට එන්නේ නැටුම්, ගැයුම්, වැයුම් ඈ කලාංග සහ සිරිත් විරිත් ය. එනමුදු, වෙනත් සංස්කෘතින් හි මෙන්ම සිංහල සංස්කෘතියේ ද පැවැත්මේ මූලික පදනම වන්නේ භාෂාව යැයි මම සිතමි. අප බොහෝ දෙනෙකුගේ අදහස ද එයම වේ. තම දරුවන්ට සිංහල ඉගැන්වීමට අප බොහෝ දෙනා වෙහෙසෙන්නේ එනිසා ය.

සිංහල සංස්කෘතියක් සිඩ්නි නගරය තුල සහ පොදුවේ නිව් සවුත් වේල්සය තුල හොඳින් ස්ථාපනය කර, ප්‍රවර්ධනය කර, චිරාත් කාලයක් රැක ගැනීමේ උදර පරමාර්ථය ඇතුව සෝමරත්න දිසානායක, උබයසිරි විජයනන්ද වික්‍රම ඇතුළු පිරිසකගේ මූලිකත්වයෙන් සිංහල සංස්කෘතික හමුව මෙහි පිහිටුවා මේ ගතවෙන්නේ විසි එක් වන වසරයි.

වසර 1990 මාර්තු මාසයේ වික්ටර් රත්නායක ගේ "ස" ප්‍රසංගය සිනුවර නුවර දී පැවැත්වීම මූලික කොට ගෙන ඇරඹුණු සිංහල සංස්කෘතික හමුව මගින් ඉනික්බිති ආරම්භ කළ එක් වැදගත් කර්තව්‍යයක් වූයේ සිඩ්නි නගරය තුල සිංහල ඉගැන්වීමේ වැඩ පිළිවෙලක් සැකසීමයි. එහි මුල් පියවර ලෙස 1990 ඔක්තෝබර් මස 27 ඉරුදින උතුරු පැරමටා පොදු පාසලේ දී සිනුවර ප්‍රථම සිංහල භාෂා පාසැල අරඹන්නට යෙදුණි.

පුරා වසර විස්සකට පසුව අද ද උතුරු පැරමටා සිංහල පාසල සිනුවර ප්‍රමුඛතම සිංහල භාෂා පාසැල ලෙසින් පවත්වාගෙන යනු ලබන බව ඉතා සතුටින් සඳහන් කළ හැකිය. මීට අමතරව, මින්ටෝ සිංහල පාසල ද, බ්ලැක්ටවුන් සිංහල පාසල ද, සිංහල සංස්කෘතික හමුවේ මග පෙන්වීම යටතේ පාසල් දෙමව්පියන් ගේ පරිපාලන කලමණාකාරීත්වයෙන් පවත්වාගෙන යනු ලැබේ.

වයස අවුරුදු හතර හමාරේ පාසල් යාම අරඹන වයසේ කුඩා දූ පුතුන් ගේ සිට අවුරුදු දහසයේ තරුණ සිසු සිසුවියන් දක්වා සිංහල දූ පුතුන් 200 පමණ මේ සිංහල භාෂා පාසල් ත්‍රිත්වයේ මේ වන විට ඉගෙනුම ලබති. දෙමව්පියන් විසින් රැස් කරන අරමුදලට අමතරව පාසල්වල පැවැත්ම සඳහා නිව් සවුත් වේල්ස රජයේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රජා භාෂා අංශයෙන් ද වාර්ෂිකව ආධාර මුදලක් ලැබෙන බව මෙහි ලා සඳහන් කළ යුතුය.

සිංහල භාෂා පාසල්වල සිසු සිසුවියන් ගේ අධ්‍යාපනය සිංහල කියවීමට, ලිවීමට සහ කතාබහ ඉගෙනීමට පමණක් සීමා නොවේ. භාෂාවක් ඉගෙනීමේ දී එහි සංස්කෘතික පදනමට ද ප්‍රමුඛ ස්ථානයක් ලබා දිය යුතුය. මේ අරමුණ පෙරදැරි කරගෙන සිංහල පාසල් සිසු සිසුවියන් වාර්ෂිකව සිනුවර පැවැත්වෙන බක් මහ රංගන මහා කලා මංගල්‍යයට සහභාගී කරගැනීමට සිංහල සංස්කෘතික හමුව වග බලා ගැණීම සතුටට කරුණකි.

සිංහල භාෂා පාසල් ත්‍රිත්වය, සිංහල සංස්කෘතික හමුව හා එක්ව සිසුන් ගේ භාෂා කුසලතා සහ සංස්කෘතිකමය අවබෝධය වර්ධනය කිරීම සඳහා සංවිධානය කරන ප්‍රධානතම උත්සවය වන්නේ ද්වි වාර්ෂික සිංහල පාසල් විවිධ ප්‍රසංගයයි. සෑම පාසලකම, සෑම පන්තියකම, සෑම සිසුවෙකුම පාහේ සහභාගී වන මේ විවිධ ප්‍රසංගය මෙවර සාර්ථක එකොලොස්වන වරට සැප්තැම්බර් මස දහඅට වෙනිදා සිනුවර තදාසන්නයේ පෙන්රිත් හි පිහිටි ජෝන් සදර්ලන්ඩ් රංග කලා මධ්‍යස්ථානයේ දී පැවැත්වීමට කටයුතු සූදානම් වෙමින් පවතී.

මේ වැදගත් කර්තව්‍යයට සහභාගී වෙන සියළුම සිංහල පාසල් දරු දැරියන්ටත්, ඔවුන්ව මේ සඳහා පුරුදු පුහුණු කරවන ගුරුවරියන්ටත්, ඒ සඳහා ඇප කැප වීමෙන් කටයුතු කරන දෙමව්පියන් සහ සිංහල සංස්කෘතික හමුවේ නියෝජිතයින්ටත් සිනුවර ආරච්චිල ගේ ස්තුතිය මෙයින් පුද කෙරේ.

අද සිනුවර හසුන අවසාන කිරීමට සිංහල පාසල් පිළිබඳව රසික සූරියආරච්චි ලියා, සංගීත් වික්‍රමසිංහ සංගීතය සපයා බ්ලැක්ටවුන් සිංහල පාසලේ ශිෂ්‍ය තිසල් වංසජ පාදුක්ක විදාන විසින් ඔහුගේ "මගේ උරුමය" සංගත තැටිය සඳහා ගායනා කරන ලද ගීයක පදවැල් යොදා ගනිමි.

සුන්දර රිවි දිනයේ
පින්බර හිමිදිරියේ
සිංහල උගෙනට පාසල වෙත යන
පෙම්බර නැගණියෙනේ
පෙම්බර මළණුවනේ

මා පිය සිත් සනසා
ගුරු උපදෙස් විලසා
සිංහල කියවමු, සිංහල උගණිමු
සිංහල බස දෙඩමු
සිංහල කම රකිමු

පිටු දැක පටු බේද
පිළිපැද අවවාද
හුයකට ඇමිණුන මුතුකැට විලසින
එකමුතු වී ඉඳිමු
යහ ගුණ දම් රකිමු

*ලබන මාසයේ නැවත හමුවෙමු.*

